218769

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1988 අංක 84 දරන
# කැලෑ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 20 වන දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---

1988 දෙසැම්බර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක.

මිළ : ශත 60 යි.    තැපැල් ගාස්තුව : ශත 75 යි

218769

# 1988 අංක 84 දරන කැලෑ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 20 වන දින.]

එල්. ඩී.—ඕ. 16/85

**කැලෑ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1988 අංක 84 දරන කැලෑ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින්මතු "ප්‍රධාන පඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) කැලෑ ආඥාපනතේ 7 වන වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— **451 වන අධිකාරයේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.**

"(3) වන සංරක්ෂකවරයාගේ, නියෝජ්‍ය වන සංරක්ෂකවරයාගේ, සහකාර වන සංරක්ෂකවරයකුගේ හෝ දිසා වන නිලධරයකුගේ ලිඛිත අනුමතය නොමැතිව, මේ වගන්තිය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් කිසිම නඩු පැවරීමක් නොකළ යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 40අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:— ප්‍රධාන ප්‍රඥප්තියෙහි අලුත් 40අ වගන්තිය **ඇතුළත් කිරීම.**

"1979 අංක 15 දරන අපරාධ නඩුවිධාන සංග්‍රහය පනතේ 306 වන වගන්තිය කැලෑ සම්බන්ධ වරදකට වරදකරු බව පිළිගන්නා හෝ වරදකරු කරනු ලැබූ තැනැත්තන්ට අදාළ නොවිය යුතු බව.

40අ. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 306 වන වගන්තියේ විධිවිධාන, කැලෑ සම්බන්ධ වරදකට වරදකරු බව පිළිගන්නා හෝ වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකුට හෝ යම් තැනැත්තකු සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 49අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 49අ **වගන්තිය** ප්‍රතියෝජනය **කිරීම.**

"කැලෑ නිලධර යන් ආදීන්ට බාධා **දැම්මීම හෝ පහරදීම** සම්බන්ධයෙන් **දණ්ඩනය.**

49අ. මේ ආඥාපනත යටතේ ස්වකීය බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී කැලෑ නිලධරයකුට, පොලිස් නිලධරයකුට හෝ කැලෑ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට බලය දී ඇති වෙනත් යම් නිලධරයකුට තර්ජනය කරන, ඔහු බිය ගන්වන, ඔහුට පහර දෙන, බාධා කරන හෝ යම් ආකාරයකින් ඔහුගේ කටයුතු හා මැදිහත්

වන යම් තැනැත්තකු වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ වරදකරු කරනු ලැබූ විට, අවුරුදු තුනකට නොඅඩු වූ ද අවුරුදු හතකට නොවැඩි වූ ද කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් දෙදහසකට නොඅඩු වූ ද රුපියල් පන්දහසකට නොවැඩිවූ ද දඩයකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය :

එසේ වුවද දිසා වන නිලධරයකුගේ, දිසාපතිවරයකුගේ හෝ පොලිස් අධිකාරිවරයකුගේ නිලයට පහළ නිලයක් නොදරන නිලධරයකුගේ අනුමතය ඇතිව මිස, මේ වගන්තිය යටතේ නඩු පැවරීමක් නොකළ යුතු ය. ”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තියේ (2) වන උප වගන්තිය ඉවත්කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

“ (2) මේ වගන්තිය යටතේ සිරභාරයට ගැනීමක් කරන සෑම නිලධරයකු ම විසින් එසේ සිරභාරයට ගනු ලැබූ තැනැත්තා, කිට්ටු ම පොලිස් ස්ථානයට හෝ කොට්ඨාසයේ පොලිස් ස්ථානයක් නොමැති නම්, කොට්ඨාසයේ ප්‍රාදේශීය ආදායම් නිලධරයා වෙත චූදිතයා චෝදනා ලබා සිටින වරද දැක්වෙන ප්‍රකාශයක් ද සමග, අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව රැගෙන යාම හෝ යවනු ලැබීම හෝ කළ යුතු ය. එසේ සිරභාරයට ගනු ලැබූ තැනැත්තා, පොලිස් ස්ථානය භාර නිලධරයා විසින් හෝ ප්‍රාදේශීය ආදායම් නිලධරයා විසින්, අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව, කිට්ටුම මහෙස්ත්‍රාත්වරයා වෙත රැගෙන යාම හෝ යවනු ලැබීම කළ යුතු ය :

එසේ වුව ද, මේ වගන්තිය යටතේ යම් තැනැත්තකු සිර භාරයට ගැනීම වන පාලකයකු විසින් හෝ අඩවි වන නිලධාරියකු විසින් හෝ කරනු ලැබූ අවස්ථාවක, පොලිස් ස්ථානය භාර නිලධරයා මගින් හෝ ප්‍රාදේශීය ආදායම් නිලධරයා මගින්, මහෙස්ත්‍රාත්වරයා වෙත ඒ තැනැත්තා ඉදිරිපත් කිරීමේ දී අනිසි ප්‍රමාදයක් ඇති වීමට ඉඩ තිබෙන බව ඒ වන පාලකගේ හෝ අඩවි වන නිලධරයාගේ මතය වන්නේ නම් ඒ වන පාලක හෝ අඩවි වන නිලධරයා විසින් ඒ තැනැත්තා කිට්ටුම මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කළ හැකි ය. ”.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය සංශෝධනය කිරීම.

(2) අමාත්‍යවරයා විසින්, (1) වන උපවගන්තියේ විධිවිධාන නොතකා—

(අ) 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ පිහිටුවන ලද රාජ්‍ය දැව සංස්ථාවේ යම් සේවා නියුක්තයකුට, මේ ආඥාපනතේ 24 වන, 27 වන, 37 වන හෝ 48 වන වගන්තියේ කාර්ය සඳහා කැලෑ නිලධරයකුගේ කර්තව්‍ය ඉටු කිරීමට ; හෝ

(ආ) 1958 අංක 4 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ හෝ 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ හෝ කෘෂිකාර්මික සංවර්ධන අධිකාරියේ යම් සේවා නියුක්තයකුට, මේ ආඥාපනතේ 27 වන, 37 වන හෝ 48 වන වගන්තියේ කාර්ය සඳහා කැලෑ නිලධරයකුගේ කර්තව්‍ය ඉටු කිරීමට ; හෝ

බලය දිය හැකි අතර, එවැනි යම් සේවා නියුක්තයකු හෝ නිලධරයකු මේ කර්තව්‍ය ඉටු කිරීමෙහි ලා නිරත වී සිටිය දී කැලෑ නිලධරයකු ලෙස සලකනු ලැබිය යුතු ය. ”.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තියේ (ඇ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය සංශෝධනය කිරීම.

“(ඇ) මේ ආඥාපනත යටතේ වූ වැරදි සම්බන්ධයකට පත් කිරීමෙහි ලා ලැබුණු මුළු මුදල් හෝ ඉන් යම් කොටසක් සහ ඒ වැරදි සම්බන්ධයෙන් තොරතුරු සපයන්නන් පිළිබඳ පාරිතෝෂික ආඥාපනත යටතේ, තොරතුරු සපයන්නන්ට දෙනු ලබන ත්‍යාග, සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක්, සහ ආණ්ඩුව විසින්, යම් රාජ්‍ය හෝ පෞද්ගලික සංස්ථාවක් විසින් හෝ යම් පුද්ගලයකු විසින් අරමුදලට ගෙවනු ලැබිය හැකි වෙනත් යම් දායක මුදලක් එම අරමුදලට ගෙවීම සඳහා සහ නියෝගවල සඳහන් කරනු ලබන යම් කොන්දේසිවලට යටත්ව, අරමුදලින්, දැනුම් දෙන්නන්ට සහ කැලෑ නිලධරයන්ට ත්‍යාග ගෙවීම සඳහා සහ මේ ආඥාපනත යටතේ ස්වකීය බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී කැලෑ නිලධරයන්ට, පොලිස් නිලධරයන්ට හෝ වෙනත් නිලධරයන්ට සිදුවන ශාරීරික හානි සම්බන්ධයෙන් වන්දි ගෙවීම

සඳහා හෝ එම හානි නිසා මරණය සිදු වූ විට ඔවුන්ගේ උරුමක්කාරයන්ට වන්දි ගෙවීම සඳහා සහ මේ ආඥාපනත යටතේ වූ නඩු විභාගවල දී සාක්ෂි දීමේ කාර්ය සඳහා අධිකරණයට පැමිණීමේ දී සාක්ෂිකරුවන් විසින් නිසි ලෙස දරන ලද ගමන් වියදම් ගෙවීම සඳහා සහ නීති විරෝධී ලෙස ගස් කැපීම සහ නීති විරෝධී ලෙස දැව ප්‍රවාහණය කිරීම නතර කිරීම සඳහා වැටලීම් කිරීමෙහි ලා දරන වියදම් ගෙවීම සඳහා සහ මේ ආඥාපනත යටතේ කැලෑ නිලධරයන්ට ස්වකීය කර්තව්‍ය කාර්යක්ෂම ලෙස කර ගෙන යා හැකි වනු පිණිස කැලෑ නිලධරයන් පුහුණු කිරීමේ වැඩ සටහන් පවත්වා ගෙන යාම ඇතුළුව, වන සංරක්ෂණ කටයුතු කිරීමෙහි ලා දරනු ලබන වියදම් සඳහා විධි විධාන සැලැස්වීම.”.

“ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය, එහි “වන නිලධාරි” යන්නෙහි අර්ථ කථනයේ “වන සංරක්ෂකවරුන්” යන්නට ඉක්බිතිව ම “අතිරේක වන සංරක්ෂකවරුන්” යන වචන එකතු කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.”